# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2066/46 - 2018 අප්‍රේල් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ
33 වන උපසම්පදා උත්සවය

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී රෝහණ සංඝ සභාවේ 33 වන උපසම්පදා උත්සවය 2018 ක් වූ අප්‍රේල් මස 22, 23 යන දෙදින තුළ ඌරපොල සිරි රතන ජෝති පිරිවෙන් විහාරස්ථ රෝහණ සංඝ සභා මූලස්ථානයේ සීමා මාලකයේ දී පැවැත්වෙන බවත්, එම උත්සවය සඳහා පැමිණෙන වන්දනාකරුවන් ප්ලාස්ටික් හා පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන රැගෙන ඒමෙන් වලකින ලෙසත් 1991 ඔක්තෝබර් මස 14 වන දින ප්‍රකාශිත එල්. ඩී. බී. 11/60 දරන 175 වැනි අධිකාරය වන වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති නිත්‍ය නියෝග හා රෙගුලාසි උපසම්පදා උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුව පවතින බවත් මෙයින් දැනුම් දෙමි.

නිල්මිණි හේරත්,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
කඹුරුපිටිය.

2018 අප්‍රේල් මස 10 වැනි දින,<br>
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 1012